# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## පෙබරවාරි මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධනය විය.

**2021 පෙබරවාරි මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය 59.4ක් වාර්තා කරමින් අඛණ්ඩ වර්ධනයක් පවත්වා ගැනීමට සමත් වූ අතර,** නිෂ්පාදන සහ නව ඇණවුම් වල සිදුවූ වර්ධනය මේ සඳහා හේතු විය. තවද, තොග මිලදී ගැනුම් සහ සේවා නියුක්ති උප දර්ශක මෙන්ම ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යාමද සමස්ත දර්ශකය ඉහළ අගයක පැවතීමට හේතු විය.

එළඹෙන උත්සව සමයේ ඉල්ලුමේ ඉහළයාම අපේක්ෂා කරමින්, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදනය ඉහළ ගිය අතර, නව ඇණවුම් උප දර්ශකය ද ඉහළ අගයක් වාර්තා කරන ලදී. තවද, රෙදිපිළි හා නිමි ඇඳුම් අංශයෙහි ද නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක යහපත් මට්ටමක පැවතුණි.

නිෂ්පාදනය ඉහළ යාමත් සමගම, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි සේවා නියුක්තිය ඉහළ වේගයකින් වර්ධනය විය. කෙසේ වුවද, රෙදිපිළි හා නිමි ඇඳුම් නිෂ්පාදන අංශයෙහි සේවා නියුක්තිය පැවැති මට්ටමේම පැවතුණි.

| විචලයය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **60.2** | **59.4** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ඇණවුම් | 60.9 | 60.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 57.1 | 61.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.6 | 52.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 59.8 | 58.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 76.1 | 63.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන වැඩි වේගයකින් වර්ධනය වුව ද, චීන අවුරුදු නිවාඩුව හේතුවෙන් සැපයුම් කෙරෙහි ඇතිවිය හැකි බාධා සැලකිල්ලට ගනිමින් වැඩිපුර තොග ඇණවුම් කර තිබීම හේතුවෙන්, තොග මිලදී ගැනුම් අඩු වේගයකින් වර්ධනය විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් ඉහළ යන ලදී.


රට තුළ මෙන්ම ප්‍රධාන අපනයන වෙළඳපොළවල ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්ගේ උප දර්ශකය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**59.4**

**2021 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.8ක පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3 කින් පහළ යමින් 2021 ජනවාරි මාසයේදී 53.5ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 ජනවාරි මාසයේදී එක්සත් ජනපදය, ඉන්දියාව සහ රුසියාව හි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, එක්සත් රාජධානිය, යුරෝපා කලාපය සහ චීනයේ එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් 1 ආයතනය, 2021 මාර්තු 14 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුළුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**සේවා අංශය තවදුරටත් වර්ධනය වීමක් පෙන්නුම් කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 පෙබරවාරි මාසයේ දී56.5 ක් දක්වා ඉහළ ගියේය** .නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි දක්නට ලැබුණු ඉහළ යෑම් මෙම වර්ධනය සඳහා දායක විය.

ප්‍රධාන වශයෙන්, වශයෙන්, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා සහ දේපළ වෙළඳාම යන උපඅංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමග සේවා අංශයේ නව ව්‍යාපාර 2021 පෙබරවාරි මාසයේ දී ඉහළ ගියේය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2021 පෙබරවාරි මාසයේ දී අඛණ්ඩව තෙවන මාසයටත් ඉහළ ගියේය. ආර්ථික කටයුතු සාමාන්‍යකරණයට පත්වීමත් සමග 2021 පෙබරවාරි මාසයේ දී ප්‍රවාහන සහ මූල්‍ය සේවා උපඅංශවල වර්ධනයක් වාර්තා විය. තවද, අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් අනතුරුව උසස් අධ්‍යාපන ආයතනවලට නවක සිසුන් බඳවා ගැනීම හේතුවෙන් අධ්‍යාපන උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය විය. මීට අමතරව, 2021 පෙබරවාරි මාසයේ දී අනෙකුත් පෞද්ගලික සේවා සහ දේපළ වෙළඳාම යන උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ද ඉහළ යෑමක් දක්නට ලැබුණි.

ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ඉහළ යෑම හේතුවෙන් ඇතැම් ආයතන නව බඳවාගැනීම් ඇරඹීමත් සමග සේවා නියුක්තියෙහි පහළ යෑම පාලනය වීමක් පෙන්නුම් කරමින් සේවා නියුක්ති උපදර්ශකය 2021 පෙබරවාරි මාසයේ දී කඩඉම් මට්ටම වන දර්ශකාංක 50ට ආසන්න විය.

COVID-19 වසංගතය හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලු හේතුකොටගෙන අවහිරතාවලට ලක් වූ ව්‍යාපාර ක්‍රියාකාරකම් සාමාන්‍යකරණයට පත්වීමත් සමග නිමකිරීමට නියමිත කාර්යයන් 2021 පෙබරවාරි මාසයේ දී පහළ යන ලදී.

| විචල්‍යය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **56.2** | **56.5** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 55.2 | 54.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 60.9 | 62.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 43.8 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 53.3 | 46.8 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 67.7 | 69.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


COVID-19 සඳහා එන්නත්කරණ වැඩසටහන ආරම්භ කිරීමත් සමග ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීම පිළිබඳව සේවා සපයන්නන්ගේ සුභවාදී අදහස් ඉහළ යෑම හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2021 පෙබරවාරි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**56.5**

**2021 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3කා ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 ජනවාරි මාසයේ පැවති 51.6 සිට 2021 පෙබරවාරි මාසයේ දී 52.8 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 පෙබරවාරි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන අතර, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 මාර්තු 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.